# කලාප අධ්‍යාපන කාර්යාලය - මතුගම

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය
Genaral Certificate of Education(Adv.Level) Examination

භූගෝල විද්‍යාව I
Geography I

22 S I

පැය තුනයි.
Three hours

**සැලකිය යුතුයි :**

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. I කොටස බහුවරණ ප්‍රශ්න 40කින් යුක්ත වන අතර, ඒවාට පිළිතුරු **මෙම පත්‍රයේම** සැපයිය යුතුය.
- II කොටසෙහි ප්‍රශ්න **දෙකටම** පිළිතුරු සැපයිය යුතුය. III කොටස ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර, තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතුය.
- මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා ශ්‍රී ලංකා මෙට්‍රික් සිතියම් කොටසක් සපයනු ලැබේ.

## I කොටස

1) මෙට්‍රික් සිතියමක $4cm^2$ ප්‍රදේශයක් මගින් සැබෑ භූමියේ කොපමණ භූමි ප්‍රමාණයක් නිරූපිතද?
   1) $1km^2$ 2) $2km^2$ 3) $4km^2$ 4) $8km^2$ 5) $16km^2$ (.................... )

2) මෙට්‍රික් සිතියමක භූ ලක්ෂණ සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
   1) අවතල බෑවුමක පහළ වටිනාකමක් ඇති සමෝච්ඡ රේඛා දුරින්ද, ඉහළ වටිනාකමක් ඇති සමෝච්ඡ රේඛා ළඟින්ද පිහිටයි.
   2) සෑම කොත් කන්දක්ම හුදෙකලා කන්දක් වේ.
   3) ආයතගාමී නිම්න කඳු වැටි විහිදෙන දිශාවට ප්‍රතිවිරුද්ධව පිහිටා ඇත.
   4) සමෝච්ඡ රේඛා බෑවුම දෙසට නෙරා ඇති ලක්ෂණය නෙරුවයි.
   5) කඳු වැටියක මුදුන් දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් ඇත. (.................... )

3) GIS පද්ධතියක දත්ත ලක්ෂ්‍ය, රේඛා හා කලාප වශයෙන් සියළුම භූ ලක්ෂණ ආකාර තුනකින් දක්වනු ලබන ක්‍රමය වන්නේ,
   1) අංකිත ක්‍රමය 2) සිව්රැසි ක්‍රමය 3) හස්තික ක්‍රමය
   4) දෛශික ක්‍රමය 5) ක්ෂේත්‍රීය ක්‍රමය (.................... )

4) වර්ෂ කිහිපයක ස්ත්‍රී - පුරුෂ විදේශගතවීම් නිරූපණයට වඩාත්ම යෝග්‍ය සිතියම් විද්‍යාත්මක ක්‍රමය වන්නේ
   1) ධාරා සටහන් 2) රේඛා ප්‍රස්ථාර
   3) වෘත්ත සටහන් 4) ද්විත්ව ටැම් ප්‍රස්ථාර
   5) සරල තීරු ප්‍රස්ථාරය (.................... )

5) ස්ථානයක නිරපේක්ෂ පිහිටීම දැක්වීමට වඩාත්ම සුදුසු තාක්ෂණික ක්‍රමය වන්නේ,
   1) අංකිත ක්‍රමය 2) ගුවන් ඡායාරූපය
   3) චන්ද්‍රිකා ප්‍රතිබිම්භය 4) ගෝලීය පිහිටීම් පද්ධතිය
   5) භූගෝලීය තොරතුරු පද්ධතිය (.................... )

6) වසර 30ක වර්ෂාපතන දත්ත ලබා දී ඇති විට ඉහළ චතුර්ථක පිහිටන අගය වන්නේ,
   1) 13 2) 15 3) 16 4) 17 5) 23 (.................... )

7) සිතියම් ප්‍රදේශයකට උතුරු මායිමෙන් ඇතුල් වන ගංගාවක් 6km ක් දකුණු දිශානුගතව ගලා, අනතුරුව නිරිත දිශානුගතව 9km ක් ගලා ගොස් නිරිත කෙළවරට 1kmක් උතුරින් පිහිටි බස්නාහිර මායිමේ ලක්ෂයකින් ප්‍රදේශයෙන් පිටවී යයි. මෙම ගංගාව සමස්ත ප්‍රදේශය තුළ ගලන දුර සිතියමේ දැක්වෙන්නේ,
   1) 7.5 cm නි. 2) 8.5 cm නි. 3) 16 cm නි
   4) 30 cm නි. 5) 32 cm නි. (.................... )

8) පහත A,B,C,D වලින් දැක්වෙන භූ විෂමතා ලක්ෂණ නිවැරදි අනුපිළිවෙළින් සඳහන් වන කාණ්ඩය තෝරන්න.






1) A- තැනිතලාව B – කොත් කන්ද C – හුදකලා කන්ද D- රළි තැන්න
2) A- කොත් කන්ද B – හුදකලා කන්ද C – තැනිතලාව D- රළි තැන්න
3) A- රළි තැන්න B – හුදකලා කන්ද C – කොත් කන්ද D- තැනිතලාව
4) A- තැනිතලාව B – හුදකලා කන්ද C – කොත් කන්ද D- රළි තැන්න
5) A- රළි තැන්න B – කඳුවැටිය C – කොත් කන්ද D- තැනිතලාව (.................... )

9) මාත බහුලව ඇති සංඛ්‍යා ව්‍යාප්තියක මධ්‍යන්‍යය සොයන සූත්‍රය පහත දැක්වේ. මෙහි $X_0$ යනු,

$$\overline{X} = X_0 + \frac{(\sum fd)\, c}{n}$$

1) පද ගණනය
2) සංඛ්‍යාතයයි.
3) උපකල්පිත මධ්‍යන්‍යය ඇති පන්තියේ මධ්‍ය අගයයි.
4) පන්ති ප්‍රාන්තරයේ පළලය.
5) අපගමනය හා සංඛ්‍යාතය ගුණ කිරීමෙන් ලැබෙන සංඛ්‍යාවල ඓක්‍යයයි. (.................... )

10) ආදර්ශ ගෝලයේ අක්ෂාංශ හා දේශාංශ සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,
1) සියලුම දේශාංශ දිගින් සමානය.
2) සමකය මහා වෘත්තයක් වේ.
3) දේශාංශ සියල්ලම මහා වෘත්ත වේ.
4) දිගම දේශාංශය ග්‍රිනිච් මධ්‍ය දේශාංශයයි.
5) ආදර්ශ ගෝලය සතුව අක්ෂාංශ 180ක් හා දේශාංශ 360ක් අන්තර්ගතය. (.................... )

11) මීතේන් (ජීව වායුව) වායුව වායු ගෝලයට එක් වන ක්‍රමයක් **නොවන්නේ,**
1) රූමාන්තිකයින්ගෙන්
2) වගුරු බිම් වලින්
3) රසායනික පොහොර භාවිතයෙන්
4) ජලය බැඳ කරන කෘෂි කටයුතුවලින්
5) අපද්‍රව්‍ය, කැළි කසල ගොඩ ගැසී පල්වන ස්ථාන වලින් (.................... )

12) ස්වභාවධර්මය සංරක්ෂණය සඳහා වූ අන්තර්ජාතික සංගමයෙහි මූලස්ථානය පිහිටියේ,
1) පැරීසිය ෆොන්ටන්බ්ලු නගරය
2) කෙන්යාව නයිරෝබි නගරය
3) ස්වීඩනය ස්ටොක්ස්හෝම් නගරය
4) ස්විට්සර්ලන්තය ග්ලෑන්ඩ් නගරය
5) බ්‍රසීලය රියෝද ජනයිරෝ නගරය (.................... )

13) ලෝක කාළගුණ දිනය සමරනු ලබන්නේ,
1) මාර්තු 08
2) මාර්තු 23
3) අප්‍රේල් 22
4) මාර්තු 22
5) ඔක්තොබර් 24 (.................... )

14) පිලිපීන් දූපත් ආශ්‍රිතව නිවර්තන වාසුළි හඳුන්වන්නේ,
1) ටයිෆූන්
2) හරිකේන්
3) සයික්ලෝන්
4) විලිවිලි
5) බැගියෝ (.................... )

15) ප්‍රභාසංස්ලේෂණයෙහි නිවැරදි ක්‍රියාවලිය වන්නේ,

1) $Co_2+H_2O \xrightarrow[\text{හරිතප්‍රද}]{SR} C_6H_{12}O_6+O_2$

2) $6Co_2+6H_2O \xrightarrow[\text{හරිතප්‍රද}]{SR} C_6H_{12}O_6+6O_2$

3) $6Co_2+6H_2O \xrightarrow[\text{හරිතප්‍රද}]{SR} 6C_6H_{12}O_6+6O_2$

4) $6Co_2+6H_2O \xrightarrow[\text{හරිතප්‍රද}]{SR} C_6H_{12}O_6+O_2$

5) $6Co_2+6H_2O \xrightarrow[\text{හරිතප්‍රද}]{SR} 12C_6H_{12}O_6+O_2$ (.................... )

16) ශීත දියවැල් දෙකක නම් නිවැරදිව දැක්වෙන්නේ පහත සඳහන් කවර පිළිතුරෙහිද?

1) බෙංගුවේලා හා පෙරුවියන්
2) කුරෝෂියෝ හා පෙරුවියන්
3) බෙංගුවේලා හා කුරෝෂියෝ
4) කුරෝෂියෝ හා කැනරි
5) ගල්ෆ් හා අගුල්හාස් (.................... )

17) අපි කේන්ද්‍රය යනු,

1) භූමි කම්පාවක් මගින් වැඩිම හානියක් කරන ප්‍රදේශයයි.
2) භූමි කම්පාවක ආරම්භක ලක්ෂයයි.
3) භූමි කම්පන රේඛයක වාර්තාවන උපරිම තීව්‍රතාවයයි.
4) භූමි කම්පාවක ආරම්භය සිදු වූ ස්ථානයයි.
5) භූමි කම්පාවක ප්‍රභවය සිදු වූ ස්ථානයේ සිට සෘජුවම පෘථිවිය මතුපිට පිහිටි ස්ථානයයි. (.................... )

18) එකිනෙකට වෙනස් වූ භූ රූප හා ක්‍රියාවලි පහත සඳහන් වේ. භූ රූපය හා ඊට සම්බන්ධ ක්‍රියාවලි නිවැරදිව දැක්වෙන්නේ කුමන පිළිතුරේද?

| | |
|---|---|
| A. අගම් ගල් | D. කාස්ට් ක්‍රියාවලිය |
| B. උවාලා | E. ගංගා ක්‍රියාවලිය |
| C. නෙත්ති නෙරු | F. ග්ලැසියර් ක්‍රියාවලිය |

1) AF, BD, CE 2) AD, BE, CF 3) AD, BF, CE 4) AF, BE, CD 5) AE, BD, CF (.................... )

19) උත්තරාර්ධගෝලයේ සූර්ය නිවෘතීන් නිවැරදිව දැක්වෙන්නේ, කවර පිළිතුරකද?

1) ග්‍රීෂ්ම සූර්ය නිවෘතිය මාර්තු 21 දින හා ශීත සූර්ය නිවෘතිය සැප්තැම්බර් 23 දිනදීය.
2) ග්‍රීෂ්ම සූර්ය නිවෘතිය ජුනි 21 දින හා ශීත සූර්ය නිවෘතිය දෙසැම්බර් 22 දිනදීය.
3) ග්‍රීෂ්ම සූර්ය නිවෘතිය මාර්තු 21 දින හා ශීත සූර්ය නිවෘතිය දෙසැම්බර් 22 දිනදීය.
4) ග්‍රීෂ්ම සූර්ය නිවෘතිය සැප්තැම්බර් 23 දින හා ශීත සූර්ය නිවෘතිය ජුනි 21 දිනදීය.
5) ග්‍රීෂ්ම සූර්ය නිවෘතිය ජුනි 21 දින හා ශීත සූර්ය නිවෘතිය සැප්තැම්බර් 23 දිනදීය. (.................... )

20) සාගර තරංග වෙරළ වෙත ඉදිරියට ගලා ඒමත් , ආපසු ගලා යාමත් හඳුන්වන්නේ,

1) පෙර පහර හා උල්ලේඛය යි.
2) පිළිසෝදාව හා සංඝර්ෂණය යි.
3) පෙර පහර හා පිළිසෝදාව යි.
4) පිළිසෝදාව හා අවලම්බනය යි.
5) උල්ලේඛය හා අවලම්බනය යි. (.................... )

21) කොළඹට වඩා නුවර එළියේ උෂ්ණත්වය සාපේක්ෂව අඩුය. මීට ප්‍රධාන හේතුව වන්නේ,

1) අහසේ පවතින වලාකුළු ප්‍රමාණයයි.
2) ශාක ගහන ව්‍යාප්තියේ වෙනසයි.
3) උච්චත්වයේ වෙනස යි.
4) ආර්ද්‍රතාවයේ වෙනස යි.
5) මුහුදේ සිට ඇති දුර ප්‍රමාණයයි. (.................... )

22) කොපන්ගේ දේශගුණ වර්ගීකරණයේ මධ්‍ය අක්ෂාංශීය කාන්තාර දේශගුණය හැඳින්වෙන්නේ කවර සංකේතයෙන්ද?

1) Db 2) Bwh 3) Bsh 4) Bwk 5) Bsk (.................... )

23) සෞම්‍ය කලාපීය තෘණ බිම් කිහිපයක ව්‍යාප්තිය A ,B ,C හ... වන්නේ,




1) A පැම්පාස් B ස්ටෙප්ස් C ප්‍රෙයරීස් D ඩවුන්ස්
2) A ප්‍රෙයරීස් B පැම්පාස් C ස්ටෙප්ස් D ඩවුන්ස්
3) A ස්ටෙප්ස් B ප්‍රෙයරීස් C පැම්පාස් D ඩවුන්ස්
4) A ප්‍රෙයරීස් B ස්ටෙප්ස් C ඩවුන්ස් D පැම්පාස්
5) A ස්ටෙප්ස් B ඩවුන්ස් C පැම්පාස් D ප්‍රෙයරීස් (.................... )

24) යමහල් කලාපයක් වන බටහිර පරි පැසිෆික් තීරයට අයත්වන රටවල් පමණක් ඇතුළත් වරණය තෝරන්න.

1) ඉක්වදෝරය, මෙක්සිකෝව, ගයනාව,උරුගුවේ
2) උරුගුවේ, ගයනාව, ඇලස්කාව, චිලී
3) චිලී, ඉක්වදෝරය, මෙක්සිකෝව, ඇලස්කාව
4) චිලී, ඇලස්කාව, උරුගුවේ, ඉක්වදෝරය
5) ඇලස්කාව, උරුගුවේ, ගයනාව, මෙක්සිකෝව (.................... )

25) කිසියම් වායු ඒකකයක් මගින් $22^0$C ක උෂ්ණත්වයකදී අවශෝෂණය කරගෙන ඇති ජලවාෂ්ප ප්‍රමාණය 30g කි. එම උෂ්ණත්වය යටතේ එම වායු ඒකකයට අවශෝෂණය කරගත හැකි ජල වාෂ්ප ප්‍රමාණය 120g කි. එවිට මෙහි සාපේක්ෂ ආර්ද්‍රතාවය කොපමණද?

1) 25% කි. 2) 40% කි. 3) 50% කි. 4) 55% කි. 5) 60% කි.

(.................... )

26) කර්මාන්තයක් ස්ථානගත වීමට බලපාන භෞතික සාධකයක් වන්නේ,

1) තාක්ෂණය 2) බලශක්තිය 3) ව්‍යවසාය 4) ශ්‍රමය 5) යටිතල පහසුකම් (.................... )

27) 21 වන සියවසේදී ශ්‍රී ලංකාව මුහුණ දෙන ප්‍රධාන අභියෝගය වන්නේ,

1) ළමා යැපුම් අනුපාතය ඉහළ යාම.
2) වැඩිහිටි යැපුම් අනුපාතය ඉහළ යාම.
3) ස්ත්‍රීන්ගේ විවාහවීමේ මධ්‍යන්‍ය වයස පහළ යාම
4) මාතෘ මර්ත්‍යතාව ඉහළ යාම.
5) වයස අවු. 20 - 29 ස්ත්‍රීන්ගේ සාඵල්‍යතාවය ඉහළ යාම. (.................... )

28) රටක ජනගහන වර්ධන වේගය 2.5 ක් නම් ජනගහනය දෙගුණ වීමට ගතවන කාලය වන්නේ,

1) අවු. 28 2) අවු. 35 3) අවු. 70 4) අවු. 80 5) අවු. 110 (.................... )

29) ලොව ඉහළම ක්‍රිස්තියානි ආගමික සමූහය වෙසෙන රටවල් ත්‍රිත්වය පිළිවෙළින් දැක්වෙන්නේ,

1) U.S.A., මෙක්සිකෝව, ඉන්දුනීසියාව
2) ඉන්දුනීසියාව , චීනය, U.S.A.
3) U.S.A., බ්‍රසීලය, මෙක්සිකෝව
4) ඉන්දුනීසියාව, පාකිස්ථානය, ඉන්දියාව
5) චීනය, තායිලන්තය, ජපානය (.................... )

30) පුරවර ප්‍රදේශයක ඇති ඉතාම වැදගත් ජනාවාස වර්ග තුන,

1) මහනගරය, කුඩා නගර හා ග්‍රාමීය ජනාවාස
2) මහනගරය, උප නගර හා කුඩා නගර
3) මහනගරය, ගැමිරික ජනාවාස හා ග්‍රාමීය ජනාවාස
4) මහනගරය, උප නගර හා ගැමිරික ජනාවාස
5) මහනගරය, උප නගර හා නගර සමූහිත (.................... )

31) පහළ මිසිසිපි නිම්නය, කැලිෆෝනියාවේ සැක්‍රටැන්ටෝ නිම්නය, අප්‍රිකාවේ නයිල් ඩෙල්ටාව, මරේඩාලිං නිම්නය හා ඉතාලියේ පෝ ගංගාධාරය ප්‍රසිද්ධ වන්නේ,

1) ආසියාවට කෘෂි තාක්ෂණය ලබාදෙන ප්‍රදේශ
2) තිරිඟු වගා කරන ප්‍රදේශ
3) ගල් අඟුරු හා යපස් කෙත් පිහිටි ප්‍රදේශ
4) ආසියාවෙන් පිටත වී වගා කරන ප්‍රදේශ
5) නැව් කර්මාන්තය ස්ථානගත වී ඇති ප්‍රදේශ (.................... )

32) කිසියම් නිෂ්පාදනයකට අවශ්‍ය විවිධ කොටස් විශේෂ ප්‍රාගුණ්‍ය යටතේ තැන් තැන් වලින් නිපදවාගෙන එක් ස්ථානයකට රැස් කර සම්පූර්ණ භාණ්ඩය සැකසීමේ කර්මාන්ත මෙසේ හඳුන්වයි.
1) මහා පරිමාණ කර්මාන්ත
2) මධ්‍ය පරිමාණ කර්මාන්ත
3) ගෘහ කර්මාන්ත
4) එකලස් කිරීමේ කර්මාන්ත
5) හස්ත කර්මාන්ත (.................... )

33) ලොව යකඩ හා වානේ ප්‍රධාන අපනයනකරු හා ආනයනකරු වන්නේ,
1) චීනය හා ඇ.එ.ජ
2) චීනය හා එක්සත් රාජධානිය
3) චීනය හා ජපානය
4) ඇ.එ.ජ හා චීනය
5) එක්සත් රාජධානිය හා ඇ.එ.ජ (.................... )

34) පෘථිවියේ අවකාශීය විවිධත්වය අධ්‍යයනය කිරීම භූගෝල විද්‍යාව ලෙස හැඳින්වූයේ,
1) කාල් රිටර් ය.
2) පෙඩ්රික් රැට්සල් ය.
3) ඇලෙක්සැන්ඩර් වොන් හම්බෝල්ට් ය.
4) ඇලන් සෙම්පල් ය.
5) රිචඩ් හාර්ට්ෂෝන් ය. (.................... )

35) ගිරාඳුරුකෝට්ටේ හා බකමූණ නාගරික මධ්‍යස්ථාන අයත් වන මහවැලි සංවර්ධන කලාප දෙක පිළිවෙළින් දැක්වෙන්නේ,
1) D හා G 2) C හා G 3) A හා C 4) C හා H 5) H හා G (.................... )

36) 2011 වර්ෂය පැවැත්වූයේ,
1). 14 වැනි ජන සංගණනය
2). 13 වැනි ජන සංගණනය
3). 12 වැනි ජන සංගණනය
4). 15 වැනි ජන සංගණනය
5). 11 වැනි ජන සංගණනය (.................... )

37) ජන සංඛ්‍යාවක වයස්ගත අයගේ ප්‍රතිශතය වැඩි වන්නේ,
1) උපත් අනුපාතිකය වැඩිවීම හා මරණ අනුපාතිකයේ අඩුවීම සමග ය.
2) උපත් අනුපාතිකය අඩුවීම හා මරණ අනුපාතිකයේ අඩුවීම සමග ය.
3) උපත් අනුපාතිකය අඩුවීම හා ශුද්ධ සංක්‍රමණ අනුපාතිකයේ වැඩිවීම සමග ය.
4) උපත් අනුපාතිකය වැඩිවීම හා ශුද්ධ සංක්‍රමණ අනුපාතිකයේ අඩුවීම සමග ය.
5) දළ උපත් අනුපාතිකය වැඩිවීම හා දළ මරණ අනුපාතිකයේ අඩුවීම සමග ය. (.................... )

38) ශ්‍රී ලංකාවේ වාර්ගික සංයුතිය අවරෝහණ පිළිවෙළට පෙළගැස් වූ විට ,
1) සිංහල, ඉන්දියානු දෙමළ, ශ්‍රී ලංකා දෙමළ, බර්ගර් , මුස්ලිම්
2) සිංහල, ශ්‍රී ලංකා දෙමළ, ඉන්දියානු දෙමළ, බර්ගර් , මුස්ලිම්
3) සිංහල, ඉන්දියානු දෙමළ, මුස්ලිම් , ශ්‍රී ලංකා දෙමළ, බර්ගර්
4) සිංහල, ශ්‍රී ලංකා දෙමළ, මුස්ලිම්, ඉන්දියානු දෙමළ , බර්ගර්
5) මුස්ලිම් , බර්ගර් , ශ්‍රී ලංකා දෙමළ, ඉන්දියානු දෙමළ, සිංහල (.................... )

39) පුමිතිරි අනුපාතයෙන් දැක්වෙන්නේ,
1) ජන සංඛ්‍යාවක ස්ත්‍රී සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස එහි පුරුෂ සංඛ්‍යාවයි.
2) ජන සංඛ්‍යාවක පුරුෂ සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස එහි ස්ත්‍රී සංඛ්‍යාවයි.
3) ජන සංඛ්‍යාවක මුළු වැඩ කරන ජන සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස එහි ස්ත්‍රී සංඛ්‍යාවයි.
4) ජන සංඛ්‍යාවක පුරුෂයින් 100ට සිටින ස්ත්‍රී සංඛ්‍යාවයි.
5) ජන සංඛ්‍යාවක මුළු වැඩ කරන ජන සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස එහි පුරුෂ සංඛ්‍යාවයි. (.................... )

40) ලෝකයේ ප්‍රධානතම තේ වගා කරන රටවල් දෙක වන්නේ,
1) චීනය හා ඉන්දියාව
2) චීනය හා ජපානය
3) කෙන්යාව හා ශ්‍රී ලංකාව
4) ඉන්දියාව හා ශ්‍රී ලංකාව
5) ශ්‍රී ලංකාව හා තුර්කිය (.................... )

## II කොටස

01) ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත ශ්‍රී ලංකාවේ 1:50000 පරිමාණයේ කැකිරාව භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත. මෙම සිතියම පදනම් කර ගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i) සිතියමේ A-B සහ C- D රේඛාවලින් දැක්වෙන බෑවුම්වල ස්වභාවය හැඳිනගෙන නම් කරන්න. *(ලකුණු 02 යි.)*

ii) අංක 01 චතුරස්‍රයේ දැක්වෙන සංස්කෘතික ලක්ෂණ දෙකක් හා අංක 02 චතුරස්‍රයේ දැක්වෙන භෞතික ලක්ෂණ දෙකක් හැඳිනගෙන නම් කරන්න. *(ලකුණු 02 යි.)*

iii) X-Y දක්වා දිවෙන වාරි මාර්ග ඇළෙහි දිග කිලෝ මීටර් වලින් දක්වන්න. *(ලකුණු 02 යි.)*

iv) අංක 03 චතුරස්‍රයේ දැක්වෙන වට රේඛාව 1:25 000 පරිමාණයට සකසමින් ඒ තුළ ප්‍රධාන මාර්ග ඇඳ දක්වන්න. *(ලකුණු 02 යි.)*

v) අංක iii හි දක්වන ලද සිතියම සඳහා රේඛීය පරිමාණය ඇඳ දක්වන්න. *(ලකුණු 02 යි.)*

vi) වයඹ කාර්තුවෙහි ජනාවාස ව්‍යාප්තිය ඉහළ වීමට බලපෑ මානව හා භෞතික සාධක එක බැගින් විස්තර දක්වන්න. *(ලකුණු 04 යි.)*

vii) සිතියම්ගත ප්‍රදේශයේ කෘෂිකාර්මික භූමි පරිභෝගයෙහි කැපී පෙනෙන ලක්ෂණ තුනක් විස්තර කරන්න. *(ලකුණු 06 යි.)*

02) ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි පහත සඳහන් දෑ ලකුණු කර නම් කරන්න. සම්මත හා නිවැරදි ක්‍රමද, වර්ණද භාවිතා කිරීමට සැළකිළිමත් වෙන්න.

| | |
|---|---|
| i) ජම්බු කාශ්මීරය | vi) 2018 වර්ෂයේ G - 20 සමුළුව පැවති රට |
| ii) බාස් සමුද්‍ර සන්ධිය | vii) 2020 වසරේ ඔලිම්පික් ක්‍රීඩා උළෙල පැවැත්වෙන රට |
| iii) බිස්කේ බොක්ක | viii) ශ්‍රී ලංකාවේ ඇඟලුම්හි ප්‍රධාන අපනයන ගැණුම්කරු වන රට |
| iv) වොල්ගා ගඟ | ix) ඔපෙක් (OPEC) සංවිධානයේ මූලස්ථානය පිහිටි නගරය |
| v) මැක්ඩොනල් වැටිය | x) ගෝලීය පිහිටීම් පද්ධතියෙහි(GPS) ප්‍රධාන පාලක මධ්‍යස්ථානය පිහිටි නගරය |

*(ලකුණු 10 යි.)*

## III කොටස

03) i) ප්‍රායෝගික භූගෝල විද්‍යාව යන්න සැකෙවින් හඳුන්වන්න. *(ලකුණු 02 යි.)*

ii) ප්‍රායෝගික භූගෝල විද්‍යාවේ භාවිතා වන ක්‍රම ශිල්ප හතරක් නම් කරන්න. *(ලකුණු 04 යි.)*

iii) ඉහත I හි දක්වන ලද ක්‍රම ශිල්ප තුනක් විස්තර කරන්න. *(ලකුණු 06 යි.)*

iv) තොරතුරු සන්නිවේදනයේදී ප්‍රායෝගික භූගෝල විද්‍යා ක්‍රම ශිල්ප මගින් ලැබෙන පිටිවහල අති මහත්ය. විමසන්න. *(ලකුණු 08 යි.)*

04) අ) i) සුදුසු උදාහරණ සහිතව ප්‍රාථමික හා ද්විතියික දත්ත යනු කවරේදැයි පැහැදිළි කරන්න. *(ලකුණු 02 යි.)*

ii) සන්තතික හා විවික්ත දත්ත සැකෙවින් හඳුන්වන්න. *(ලකුණු 02 යි.)*

iii) නියදිය හා සංගහනය යන්න සැකෙවින් හඳුන්වන්න. *(ලකුණු 02 යි.)*

ආ) දත්ත වලින් කුමන ප්‍රතිශතයක් ,

i) අන්තර් චතුර්ථක පරාසයට අයත් වේද? *(ලකුණු 02 යි.)*

ii) ඉහළ චතුර්ථකයට ඉහළින් ඇති දත්ත සමූහය ලබා ගනීද? *(ලකුණු 02 යි.)*

ඇ) i) මෙම දත්ත කාණ්ඩය පාදක කොටගෙන විසරණ සටහනක් නිර්මාණය කරන්න. (ලකුණු 06 යි.)

**සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මහනුවර (2001 - 2015)**

| වර්ෂය | 2000 | 2001 | 2002 | 2003 | 2004 | 2005 | 2006 | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| mm | 167 | 166 | 129 | 128 | 150 | 130 | 133 | 162 | 144 | 136 | 140 | 154 | 128 | 148 | 126 | 157 |

*මූලාශ්‍රය:- ශ්‍රී ලංකා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, 2016*

ii) විසරණ සටහන ආධාරයෙන් පළමු හා තෙවන චතුර්ථක සොයන්න. (ලකුණු 04 යි.)

05) i) දුරස්ථ සංවේදය යන්න සැකෙවින් හඳුන්වන්න. (ලකුණු 03 යි.)

ii) දුරස්ථ සංවේදයේ වාසි සහ අවාසි දෙක බැගින් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි.)

iii) ගෝලීය පිහිටීම් පද්ධතියෙහි මූලික සංරචක **තුන** සඳහන් කරන්න. (ලකුණු 03 යි.)

iv) භූගෝලීය තොරතුරු පද්ධතියක අවකාශීය දත්ත ගබඩා කිරීමේ ආකෘති **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි.)

v) සිතියම් තලයක් යනු කුමක්ද? (ලකුණු 02 යි.)

vi) ගුණාත්මක සිතියමක් නිර්මාණයට භූගෝලීය තොරතුරු පද්ධතියෙන් ලැබුණු පිටිවහල කරුණු **තුනක්** ඇසුරින් විමසන්න. (ලකුණු 06 යි.)

06) අ) අංක 02 වගුවෙහි දැක්වෙන දත්ත නිරූපණය කිරීම සඳහා ඡේදිත වෘත්ත ප්‍රස්තාරයක් අඳින්න.
(r= 4.5 cm ලෙස ගන්න)

**බෝග අනුව ශ්‍රී ලංකාවේ පොහොර භාවිතය**
**(මෙට්‍රික් ටොන් දහස් ගණනින්)**

| බෝගය | 1998 |
|---|---|
| වී | 315 |
| තේ | 165 |
| රබර් | 10 |
| පොල් | 45 |
| ක්ෂේත්‍ර බෝග | 40 |
| අපනයන බෝග | 10 |
| වෙනත් | 30 |
| එකතුව | 615 |

*මූලාශ්‍රය:- ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව, 1999*

(ලකුණු 12 යි.)

ආ) අංක 02 වගුවෙහි දැක්වෙන දත්ත නිරූපණය කිරීම සඳහා ඡේදිත වෘත්ත ප්‍රස්තාරය හැර වෙනත් යෝග්‍ය ප්‍රස්තාර ක්‍රමයක් කටු සටහන් ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08 යි.)